........................................

.......................................

**2024.05.01 දින සිට 2024.10.31 දින දක්වා දක්වා කාලය  තුළ බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත සත්ව ආහාර (compound animal feed  ) සැපයීම සඳහා මිළ ගණන් කැදවීම**

2024.05.01 දින සිට 2024.10.31දක්වා කාලය තුල බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත පහත සඳහන් සත්ත්ව ආහාර වර්ග සැපයීම සඳහා සැපයුම් කරුවන්ගෙන් /සත්ත්ව ආහාර නිපදවන්නන්ගෙන් (මින් පසු සැපයුම් කරුවන් ලෙස හඳුන්වන) ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් මිළ ගණන් කැදවනු ලැබේ.

| No. | Item | Qty. |
|---|---|---|
| 1 | Layer Crumble (50 Kg Bag) | 2016 |
| 2 | Grower Crumble (50 Kg Bag) | 170 |
| 3 | chick starter (25 Kg Bag) | 56 |
| 4 | Cattle Feed (25 Kg Bag) | 225 |
| 5 | Broiler Starter (50 Kg Bag) | 30 |
| 6 | Shell (25 Kg Bag) | 56 |

මිළ ගණන් "අ ආකෘතිය" අනුව සම්පූර්ණ කර අත්සන් තබා 2024.04.22 . දින ප.ව.2.00 ට පෙර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බ.ප), කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, බස්නාහිර පළාත් සභාව, 7 වන මහල, අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් හෝ අතින් ගෙනවිත් ලංසු පෙට්ටියට දැමිය යුතුවේ. ලංසු බහාලූ කවරයේ වම් පස ඉහළ කෙලවරේ ***සත්ත්ව ආහාර සඳහා මිළ ගණන් 2024*** යනුවෙන් සටහන් කර තිබිය යුතුවේ.

ලංසු කරු විසින් වෙළද නාම කිහිපයක සත්ත්ව ආහාර සඳහා මිළ ගණන් ඉදිරි පත් කිරීමට බලාපොරෙත්තු වන්නේ නම් එක් එක් ආයතනය සඳහා වෙන වෙනම ඇමුණුම ඇ ආකෘතිය ( මිළ උපලේඛණය ) බැගින් ඉදිරි පත් කළ යුතුවේ.

සභාපති
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (බ.ප)

SPECIMAN

**2024.05.01 සිට 2024.10.31 දක්වා බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් සඳහා සත්ව ආහාර (compound animal feed) සැපයීම**

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව(බ.ප.)**

ලංසුකරුගේ/ආයතනයේ නම - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - -

- - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - -

ලිපිනය - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - -

- - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - -

- - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - -

- - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - -

දුරකථන අංකය - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - -

ෆැක්ස් අංකය - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - -

ව්‍යාපාර ලියාපදිංචි අංකය - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - -

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (බ.ප.)

දුරකථන අංකය - 011-2092675

011-2092679

ෆැක්ස් අංකය - 011-2092666

**2024.02.15 දින සිට 2025.2.15දක්වා කාලය තුළ බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් සඳහා සත්ව ආහාර සහ අමුද්‍රව්‍යය (compound animal feed) සැපයීම**

1. ප්‍රසම්පාදනය පිළිබඳ පොදු කොන්දේසි . “අ” ඇමුණුම
2. ප්‍රසම්පාදන ආකෘති පත්‍රය. “ආ” ඇමුණුම
3. ඇස්තමේන්තු ප්‍රමාණයන් සහ මිළ උපලේඛණය. “ඇ” ඇමුණුම
4. කොන්ත්‍රාත් ගිවිසුම. “ඈ” ඇමුණුම
5. බෙදා හැරීමේ ලේඛනය “ඉ” ඇමුණුම
6. ලංසු ඇපකරයේ ආකෘතිය “ඊ” ඇමුණුම

SPECIMAN

ඇමුණුම“අ”

<u>2024.05.01 සිට 2025.10.31 දක්වා **කාලය තුළ බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් සඳහා සත්ව ආහාර (compound animal feed )සැපයීම ප්‍රසම්පාදනය සඳහා පොදු කොන්දේසි**</u>

| | | |
|---|---|---|
| 01. | **හැඳින්වීම.** | |
| | (අ) | <u>2024.05.01 සිට 2024.10.31 දක්වා කාලය තුළ බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් සඳහා සත්ව ආහාර (compound animal feed සැපයීම</u> (මෙහි මින් ඉදිරියට සත්ව ආහාර ලෙස දැක්වෙන) සඳහා දෙපාර්තෙමින්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ලංසු කැඳවනු ලැබේ. |
| | (ආ) | බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 204, 7 වන මහල, බස්නාහිර පළාත් සභාව, කෘෂිකර්ම දෙපාරතෙමින්තුවේ සංවර්ධන අංශයෙන් (ගිණුම් අංශය වෙත රුපියල් දහසක ආපසු නොගෙවන ටෙන්ඩර් පත් ගාස්තුවක් ගෙවා රිසිට් පතක් ලබා ගැනීමෙන් අනතුරුව) 2024.04.02 වැනිදින සිට 2024.04.22 වැනි දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව.3.00 තෙක් ප්‍රසම්පාදන ආකෘති පත්‍ර ලබා ගත හැකිය. |
| | (ඇ) | 2024.04.22 දින ප.ව.2.00 ට ලංසු පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කිරීම සිදු කරනු ලබයි. |
| 02. | ප්‍රසම්පාදන ලියවිලි . | |
| | (අ) | ප්‍රසම්පාදන ලියවිලි පහත සඳහන් පරිදි විය යුතුය.<br>1. ප්‍රසම්පාදන ආකෘති පත්‍රය. “ආ” ඇමුණුම<br>2. ඇස්තමේන්තු ප්‍රමාණයන් සහ මිළ උපලේඛණය. “ඇ” ඇමුණුම<br>3. කොන්ත්‍රාත් ගිවිසුම. “ඇ” ඇමුණුම<br>4. ව්‍යාපාර ලියාපදිංචි සහතිකය<br>5.පසුගිය මාස 6 බැංකු ගිණුම් සාරාංශය<br>6. සත්ව ආහාර සැපයීම පිළිබඳ පූර්ව අත්දැකීම් තිබේ නම් සනාථ කිරීමේ ලේඛණ<br>7.නිෂ්පාදක ආයතනයේ නියෝජිතයකු බවට සහතිකයක් සහ නිෂ්පදක ආයතනය අඛණ්ඩව සැපයම් කරු වෙත සත්ව ආහාර සපයන බවට සහතිකයක්<br>8.ලංසු ඉදිරිපත් කර ඇති සත්ව ආහාර සත්ව අහාර පණත යටතේ ලියාපදිංචි සහතිකය<br>9. ලංසු සුරක්ෂණය |
| | (ආ) | ලංසු ලේඛණවල ලංසු කරුවන් විසින් සඳහන් කර ඇති කරුණු වල ඇති කවර ආකාරයේ හෝ දෝෂ පිළිබද සියලු අවධානම් සම්බන්ධයෙන් ලංසුකරුවන්වන් වග කිව යුතු හෙයින් සිය යහපත තකා මෙම ප්‍රසම්පාදනයට අදාළ සියළු කොන්දේසි ගැන දැනුවත් වන ලෙස ලංසුකරුකරුවන්ට උපදෙස් දෙනු ලැබේ |
| | (ඇ) | වැඩිමනත් විස්තර දුරකථන අංක 011-2092675 සහ 011-2092679 ඔස්සේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ (බ.ප.) සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) හෝ ගණකාධිකාරී වෙතින් හෝ ප්‍රසම්පාදන විෂය භාර නිළධාරී ගෙන් ලබා ගත හැක. |
| 03. | ලංසුපත් ඉදිරිපත් කිරීම. | |
| | (අ) | ජේද 01 “ආ” අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (බ.ප) නිකුත් කරනු ලබන ප්‍රසම්පාදන ආකෘති පත්‍ර මගින් පමණක් මිල ගණන් ඉදිරිපත් කළ යුතු අතර සියලුම වෙනස් කිරීම් සහ මකා දැමීම් ලංසුකරු විසින් පුරවා ඇති හෝ ලියා ඇති සහ කෙටි අත්සන යොදා ඇති සියලුම පිටු ඇතුළත්ව ප්‍රසම්පාදන ලියවිලි ඉදිරිපත් කළ යුතුය. |
| | (ආ) | ලංසුකරු විසින් ප්‍රසම්පාදන ආකෘති පත්‍ර වල මුල් පිටපත සහ අනු පිටපත වෙන වෙනම ලියුම් කවර වල බහා සියල්ල එක් ලියුම් කවරයකට ඇතුලත් කර මුද්‍රා තබා ජේද 3 “ඇ” හෝ 3 “ඉ” වල සඳහන් ස්ථානයන්ට සහ එහි සඳහන් ආකාරයට තම මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. ලංසු පත් වල මුල් පිටපත සහ අනුපිටපත පැහැදිලිව හඳුනා ගත හැකි පරිදි ලියුම් කවරයේ ඉහල කෙලවරේ වෙන වෙනම සඳහන් කල යුතුය.ලංසුකරුගේ නම සහ ලිපිනය සෑම ලිපි කවරයකම ඇතුලත් කල යුතු වේ. |
| | (ඇ) | 2024.04.22. දින ප.ව.2.00 ට පෙර ලැබෙන සේ සභාපති දෙපාර් තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, බස්නාහිර පළාත් සභාව, 7 වන මහල, අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් එවිය හැක. ලංසුපත් බහාලන කවරයේ වම්පස ඉහකෙලවරේ **“ සත්ව ආහාර සැපයීම සඳහා මිල ගණන් 2024”** යනුවෙන් සඳහන් කළ යුතුය. |
| | (ඉ) | ලියාපදිංචි තැපැල මගින් මිල ගණන් ඉදිරිපත් නොකරනු ලබන පුද්ගලයන් හා ඔවුන්ගේ නියෝජිතයන් විසින් තමන්ට අදාල මිල ගණන් ජේදය 3 “ඇ” පරිදි සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තබා ඇති ලංසු පෙට්ටියේ නියමිත දිනට හා වේලාවට ප්‍රථම බහාලිය හැක. |
| | (ඊ) | ලංසුකරුවන් විසින් නියමිත පරිදි අත්සන් කරන ලද ප්‍රසම්පාදන ලේඛණ පහත සඳහන් අනුපිළිවෙලට ඉදිරිපත් කල යුතුය.<br>1. ප්‍රසම්පාදන ආකෘති පත්‍රය. “ආ”ඇමුණුම<br>2. ඇස්තමේන්තු ප්‍රමාණයන් සහ මිළ උපලේඛණ- සාරාංශ හා විස්තර වාර්තාව. “ඇ”ඇමුණුම<br>3. සත්ව ආහාර සැපයීමට අදාල කොන්ත්‍රාත් ගිවිසුම “ඇ” ඇමුණුම |

SPECIMEN

| | | |
|---|---|---|
| | (උ) | ප්‍රසම්පාදන උපලේඛණ වල සිදු කරන සෑම වෙනස් කිරීමක් හා මැකීමක් ඉදිරියෙන් ලංසුකරු විසින් කෙටි අත්සන යෙදිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වුවහොත් එකී ප්‍රසම්පාදන මිළ ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. |
| | (ඌ) | ප්‍රසම්පාදන මිල ගණන් පැහැදිලිව ලියා හෝ මුද්‍රණය කොට ඉලක්කමෙන් සහ අකුරෙන් සදහන් කළ යුතුය . ඉලක්කමෙන් සදහන් මිල ගණන් සහ අකුරින් සදහන් මිල ගනන් අතර වෙනසක් ඇතොත් අකුරින් සදහන් මිල ගණන් නිවරැදි සේ පිළිගනු ලැබේ. |
| 04. | ලංසුභාර ගැනීම අවසන් කරන දිනය හා වේලාව. | |
| | (අ) | 2024.04.22 . දින ප.ව.2.00 ට ට ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසුවිවෘත කරනු ලැබේ. |
| | (ආ) | ලංසු විවෘත කරනු ලබන වේලාවේදී ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. එම වේලාවේදී පැමිණ සිටින අයට පහත සදහන් තොරතුරු කියවා දෙනු ලැබේ.<br>1. එක් එක් ලංසු කරුගේ නම සහප්‍රසම්පාදන ආකෘති පත්‍රයේ සදහන් මුදල.<br>2. ලංසු බැදුම්කරයක් ඉදිරිපත් කර ඇත් ද නැත් ද යන්න සහ ඉදිරිපත් කොට ඇත්නම් එහි සදහන් මුදල. |
| | (ඇ) | ලංසුපත් භාරගැනීම අවසන් වූ දිනට සහ වේලාවට පසුව ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. |
| 05 | මිළ ගණන් වල වලංගුභාවය. | |
| | | ලංසුකරු විසින් ඉදිරිපත් කරන ලද මිළ ගණන් ස්ථිර විය යුතු අතර ඒවා ලංසු භාර ගැනීම අවසන් කරනු ලැබීමෙන් පසු මිළගණන් වල වෙනස් කිරීම සදහා අවසර දෙනු නොලැබේ. |
| 06. | මිළ ගණන් ඉදිරිපත් කිරීම. | |
| | | මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී එකතු කළ අගය මත බද්ද ඇතුලත් කල හැකිය. මෙහිදී අදාල වන්නේ නම් එකතු කළ අගය මත බදු වටිනාකම මිල උපලේඛණයේ පැහැදිලිව සටහන් කල යුතුය.( එකතු කල අගය මත බදු ලියාපදිංචි අංකයද සදහන් කරන්න) ලංසුකරු විසින් ඉදිරිපත් කරන ලද මිළගණන් යටතේ අදාල කාල පරිච්ඡේදය පුරාම සැපයිය යුතු අතර කිසිදු අවස්ථාවකදී මිල වැඩිකිරීමකට අවසර දෙනු නොලැබේ.කෙසේ වුවද විනිමය අනුපාතිකයේ හෝ වෙළද පොළ මිළ ගණන් වල 30.% වඩා වැඩි වීමක් සිදු වු අවස්ථාවක සැපයුම් කරු ඉල්ලීමක් කළ හොත් ප්‍රසම්පාදන මංඩලය විසින් ඒ පිලිබදව සලකා බැලීමක් කරනු ඇත. |
| 07. | මිළ උපලේඛණය. | |
| | | මිළ ගණන් ඉදිරිපත් කළ යුත්තේ ‘ආ’ ඇමුණුමේ සදහන් උපලේඛණයට අනුකූලවය.ඔබ විසින් ඉදිරිපත් කරන ලේඛණයක ඉදිරිපත් කරන්නේ නම් දෙපාර්තමේන්තු ආකෘතියට අනුවම සකස්කල එකක් විය යුතුය. |
| 08. | ඇගයීම් නිර්නායක. | |
| | (අ) | ලංසු පරීක්ෂා කිරීමෙන් පසු සුදුසු ලංසු කරුවකු තෝරා ගැනීම සදහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් විසින් විස්තරාත්මක ඇගයීමක් කරනු ලැබේ. එක් එක් සැපයුම්කරුගේ ලංසු ඇගයීමකට ලක් කර රජයට ඉතාමත් වාසිදායක වන ඇගයුම් කරන ලද අවම මිළගණන් ඉදිරිපත් කර ඇති ලංසු තෝරා ගනු ලැබේ. |
| | (ආ) | ලැබී ඇති ලංසු සවිස්තරාත්මක ඇගයීමකට ලක්කිරීමට පෙර පහත සදහන් මූලික සුදුසකම් සපුරා ඇත්දැයි යන්න පිළිබද තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සලකා බලනු ලැබේ.<br>1.ලංසු ලේඛණවල සදහන් සුදුසුකම් ලැබීමේ නිර්ණායක සපුරා ඇත්ද,<br>2.අවශ්‍ය ලියකියවිලි නිසි ලෙස අත්සන්කොට ඉදිරිපත් කර ඇත්ද,<br>3.ප්‍රසම්පාදනය සමග අවශ්‍ය ඉල්ලා ඇති ලේඛන සහ සනාථ කිරීම් ඉදිරිපත් කර ඇත්ද,<br>4.ප්‍රසම්පාදන කොන්දේසි පිළිබදව ලංසුකරු ප්‍රමාණවත් ප්‍රතිචාරයක් දක්වා ඇත් ද<br>5. ලංසු සුරක්ෂනය<br>ඉහත සුදුසු කම් සපුරා නොමැති ලංසු ඇගයීමකින් තොරවම ප්‍රතික්ෂේප කරනු ඇත.එසේම කොංදේසි සහිතව ඉදිරිපත් කර ඇති ලංසු පත්‍රද ප්‍රතික්ෂේප කරනු ඇත. |
| | (ඇ) | තාක්ෂණික ඇගයීම් කමිටුවේ මුලික පරීක්ෂණයෙන් පසුව පහත සදහන් කරුණු සම්බන්ධයෙන් සවිස්තරාත්මක පරීක්ෂණයක් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සිදු කරනු ලැබේ.<br>1.ඒකක මිළ<br>2.පූර්ව අත්දැකීම් හා කාර්යසාධනය.<br>3.ව්‍යාපාර ලියාපදිංචි<br>4.ගුණාත්මක භාවය සහ ප්‍රමිතීන්ට අනුකූල වීම.<br>5. පෙර සපයා ඇති සත්ව ආහාර පිළිබද පැමිණිලි<br>6. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සත්ව ආහාර නිෂ්පාදන ආයතනයක නිෂ්පාදිත සත්ව ආහාර හෝ ආනයනයක සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබිම. |
| 09. | අසාමාන්‍ය ගාස්තු. | |
| | (අ) | යම් සත්ව ආහාරයක් සම්බන්ධයෙන් ලංසුකරු විසින් අසාමාන්‍ය අඩු ගාස්තු ඉදිරිපත් කර ඇත්නම් ලංසුකරු විසින් එම අඩු ගාස්තු මගින් එම කාර්යය සපුරාලන්නේ කෙසේදැයි අදාල ගාස්තු පිළිබද විශ්ලේෂණයක් ද ප්‍රසම්පාදන මණ්ඩල තාක්ෂණික ඇගයීම් කමිටුව සෑහීමකට පත් වන පරිදි ඔප්පු කරන ලෙස ලංසුකරුට දැනුම් දෙනු ලැබේ. |
| | (ආ) | මේ සම්බන්ධව කළ පැහැදිලි කිරීම් පිළිගත නොහැකිනම් හා එම ගාස්තු මත ක්‍රියාත්මක වීමෙන් ප්‍රසම්පාදනය අසාර්ථක වන්නේ යැයි ප්‍රසම්පාදන මණ්ඩලයේ තාක්ෂණික ඇගයීම් කමිටුවේ අදහස නම් මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉදිරිපත් කරනු ලබන පැහැදිලි කිරීම් පිළිගෙන තාක්ෂණික ඇගයීම් කමිටුව ප්‍රසම්පාදන මණ්ඩලය සෑහීමකට පත් වන්නේ නම් ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කරනු ලැබේ. |
| | ඉ) | සාමන්‍ය වෙළද පොළ මිළ ගණන්වලට වඩා අධික මිළ ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී එකම ලංසුව වුවද තාක්ෂනික ඇගයීම් කමිටුවට සහ ප්‍රසම්පාදන මංඩලයට එය පිලි ගත නොහැකි නම් ලංසු කරුගෙන් එය සාධාරණ මිලකට අඩු කරන ලෙසට දැනුම් දී ඒ සදහා යහපත් ප්‍රතිචාරයක් නොලැබුණ හොත් එම ලංසුව ප්‍රතික්ෂේප කරන සුදුසු ක්‍රම වේදයකින් නැවත ලංසු කැදවීමට අධ්‍යක්ෂවරයා තීරණය කරනු ඇත.. |
| 10. | ප්‍රසම්පාදනය භාර නොගැනීම සම්බන්ධයෙන් දඩුවම. | |
| | | තමන්ට ප්‍රසම්පාදනය භාර දීමට ඇති බවට සදහන් ලිපියේ දින සිට ලිඛිත නිවේදනයක් ලැබී වැඩ කරන දින 14 ක් ඇතුලත ලංසුකරු ගිවිසුමට එළඹීමට ප්‍රතික්ෂේප කලහොත්හෝ පැහැර හැරියහොත් ඔහුගේ නම අසාදු ලේඛණගත |

| | | |
|---|---|---|
| | | කරනු ලැබේ. ලංසුකරු විසින් ඉදිරිපත් කර ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ප්‍රසම්පාදනය භාරගත් බවට කෙරෙන දැන්වීමක් ලැබුවා සේ සලකනු ලැබේ. |
| 11. | පැහැර හැරීම | |
| | | සැපයුම්කරු විසින් සපයනු ලබන සත්ව ආහාර නිසි වේලාවට භාර නොදෙන්නේ නම් හෝ සත්ත්ව පරිභෝජනයට නුසුදුසු සත්ව ආහාර සපයයි නම් හෝ සපයන ලද සත්ව ආහාර ප්‍රමිතියට වඩා පහළ මට්ටමක තිබේ නම් හෝ කොන්ත්‍රාත්කරු සැපයීම් කිරීමට ක්‍රියාශීලී ලෙස නිරත නොවන්නේ නම් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට එකී ක්‍රියාවන්ගෙන් සිදු වන පාඩුව සැපයුම්කරුගෙන් අය කර ගැනීමට හෝ ලංසුව අවලංගු කිරීමට හෝ එම ක්‍රියාවන් දෙකම කිරීමට හෝ බලය ඇත්තේය. කොන්ත්‍රාත් කාලය තුල ඇනවුම් කරන ප්‍රමාණය නොකඩවා සැපයීමට අපොහොසත් වන්නේ නම් ඔබගේ කාර්ය සාධන ඇප සුරක්ෂණය රාජ සන්තක කරනු ලැබේ. |
| 12. | ලංසුව පිළිබද සලකා බැලීම | |
| | (අ) | යම් ලංසුව ක් සම්බන්ධයෙන් මෙහි සඳහන් සියලු කොන්දේසි සපුරාලීමට නොහැකි නම් එම ලංසුව ප්‍රතික්ෂේප කරනු ලැබේ. |
| | (ආ) | ලංසුව ප්‍රශ්න කිරීමෙන් තොරව මුළුමනින්ම ප්‍රතික්ෂේප කිරීමට හෝ යම් කොටසක් පමණක් පිළිගැනීම මිල ගණන් පිළිබද සාකච්චා කිරීමේ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලය සතු වේ. එවැනි අවස්ථා වල ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණය අවසාන තීරණ වේ. |
| | (ඇ) | “ආ” ඇමුණුමේ විස්තර කරන සත්ව ආහාර වලින් යම් ප්‍රමාණයක් ඇණවුම් කිරීමේ අයිතිය පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යකෂවරයා සතු වේ. ඇ ඇමුණුමේ සදහන් සත්ව ආහාර වලින් යම් කොටසක් ඇණවුම් කිරීමේදී අධ්‍යකෂවරයා වෙතින් සිදු වන අත්හැරීමක් හේතු කොට ගෙන ඇති වන හානි සඳහා වන්දි වශයෙන් අධ්‍යකෂවරයා හෝ රාජ්‍ය නිලධාරීන්ගෙන් යම් ගෙවීමක් ඉල්ලා සිටීමට කොන්ත්‍රාත්කරුට හිමිකමක් නොමැත. |
| | (ඈ) | රජයේ කොන්ත්‍රාත් පැහැර හරින්නන්ගේ ලේඛණයේ නම සඳහන් තැනැත්තෙකුට ලංසු ඉදිරිපත් කිරීමට හිමිකමක් නොමැත. එවැනි ලංසුවක් සඳහා කොන්ත්‍රාත්තුවකට ඇතුළත් වීමට හිමිකමක් නොමැත. |
| 15. | ගිවිසුම . | |
| | (අ) | සාර්ථක ලංසුකරු විසින් මෙහි ඇතුළත් ආ ඇමුණුම මගින් බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා සමග කොන්ත්‍රාත් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. |
| | (ආ) | සාර්ථක ලංසුකරු විසින් නියමිත පරිදි ගිවිසුම අත්සන් කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඔහු කොන්ත්‍රාත් පැහැර හරින්නෙකු වශයෙන් සලකනු ලබයි |
| 13. | අතුරු කොන්ත්‍රාත්. | |
| | (අ) | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොලබා කොන්ත්‍රාත්තුව හෝ කොටසක් වෙනත් අයෙකුට පැවරීම හෝ අතුරු බදු දීම නොකල යුතුය. |
| | (ආ) | කොන්ත්‍රාත්කරු වෙනුවෙන් කොන්ත්‍රාත් සැපයීම කරගෙන යාම සඳහා යම් තැනැත්තෙකුට බලය පවරමින් කොන්ත්‍රාත්කරු විසින් නිකුත් කරනු ලබන ඇටෝර්නි බලපත්‍රය ප්‍රතික්ෂේප කිරීම හෝ පිළිගැනීමේ අයිතිය අධ්‍යකෂවරයා සතු වේ. |
| | (ඇ) | කොන්ත්‍රාත්කරු විසින් අදාල කොන්ත්‍රාත්තුවේ සැපයීම කරගෙන යාම සඳහා රජයේ කොන්ත්‍රාත් පැහැර හරින්නන්ගේ ලේඛණයේ නම සඳහන් කාණ්ඩය වෙත ඇටෝර්නි බල පත්‍රයක් නිකුත් නොකල යුතුය. |
| 14. | පැහැර හැරීම වෙනුවෙන් මිල දී ගැනීම. | |
| | (අ) | තෝරා ගන්නා ලද කොන්ත්‍රාත්කරුවන් විසින් සපයනු ලබන සත්ව ආහාර ප්‍රමිතීන්ට අනුකූල විය යුතු අතර සත්ව ආහාර භාර ගන්නා නිලධාරීන් විසින් පරීක්ෂාවට ලක් කිරීමෙන් පසුව සත්ව පරිභෝජනය සඳහා සුදුසු නොවන බව පෙනී ගිය හොත් අදාල නිලධාරියාට එම සත්ව ආහාර ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ඇති අතර එම සත්ව ආහාර නියමිත පිරිවිතරයන්ට හා ප්‍රමිතීන්ට අනුකූලව නැවත සැපයීම කොන්ත්‍රාත්කරු විසින් කල යුතුය. |
| | (ආ) | ඇණවුම් කරන ලද සත්ව ආහාර නියමිත වේලාවට සැපයීම හෝ නියම කරන ලද කාල වකවානුව තුළ ප්‍රතික්ෂේපිත සත්ව ආහාර වෙනුවෙන් නව සත්ව ආහාර සැපයීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වන්නේ නම් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා තමාට සුදුසු යැයි හැගෙන ආයතනයකින් සත්ව ආහාර වල මිල ගණන් ගැන නොතකා සැපයීම පැහැර හරින ලද සත්ව ආහාර වලට සමාන ද්‍රව්‍ය මිල දී ගැනීමේ අයිතියක් තිබේ.එවැනි අවස්ථාවක ගිවිසුම් ගත මුදලට වඩා වැඩි මුදලක් ගෙවීමට සිදුවන්නේ නම් එම ගිවිසුම කඩ කළ සැපයුම් කරුගෙන් අය කර ගැනීමට අධ්‍යක්ෂ වරයාට බල හිමිවේ. |
| 15. | කොන්දේසි. | |
| | (අ) | ඇණවුම ලිඛිතව ඉදිරිපත් කරන අතර අවශ්‍යතාවය අනුව සත්ව ආහාර වරින් වර ඇණවුම් කරනු ලැබේ. සෑම ඇණවුමක්ම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ හෝ බලය ලත් නිළධාරියෙකු විසින් ඉදිරිපත් කරනු ලැබේ. තෝරා ගන්නා ලද සැපයුම්කරු ඇණවුම් කරන ලද සත්ව ආහාර ඇණවුම් කරන නිලධාරියා නියම කරන පරිදි සැපයීම සඳහා සූදානම්ව සිටිය යුතුය. |
| | (ආ) | ඇණවුම් කරනු ලබන සත්ව ආහාර **ඇමුණුම “ඊ”** හි සඳහන් කරන ස්ථාන වල ගබඩා හා සැපයුම් භාර නිලධාරි වෙත කාර් යාල වේලාව තුල ඉල්ලුම් කර ඇති උපරිම ප්‍රමාණයනට යටත්ව ගෙනවිත් භාරදිය යුතුය. |
| | (ඇ) | සපයනු ලබන සත්ව ආහාර ඉතා හොඳ තත්ත්වයෙන් තිබිය යුතු අතර කල් ඉකුත් වන දිනය සපයන දින සිට ඉදිරියට අවම වශයෙන් මාසයක් වත් තිබිය යුතුය.<br>සත්ව ආහාර ප්‍රවාහනයේදී හා සපයන තෙක් ගබඩා කිරීමේදී අවශ්‍ය නියමිත තත්වයෙන් නඩත්තු කල යුතුය. සපයනු ලබන සත්ව ආහාර සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වරයා විසින් හෝ ඔහුගේ අනුයෝජකයින් විසින් පරීක්ෂාවට භාජනය කොට අනුමත කරනු ලැබේ.කොන්ත්‍රාත්තුවේ ප්‍රමිතීන්ට අනුකූල නොවන ද්‍රව්‍ය ප්‍රතික්ෂේප කරනු ලබන අතර කොන්ත්‍රාත්කරුගේ වියදමින් ඒවා ඉවත් කරගත යුතුය. |
| | (ඈ) | සත්ව ආහාර ඇනවුම් කර ඇති පරිදි සැපයිය යුතුය.ඇනවුම් කරන සත්ව ආහාර ප්‍රමාණය දෙපාර්තමේන්තුවේ අවශ්‍යයතාවය අනුව වෙනස් විය හැකිය. |
| | (ඉ) | සපයනු ලබන සත්ව ආහාර සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සත්ව ආහාර නිෂ්පාදන ආයතනයකින් නිෂ්පාදනය කල සත්ව ආහාර විය යුතුය. |
| | (ඊ) | සත්ව ආහාර සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමේදී එම සත්ව ආහාර වල අඩංගු පෝෂක, ඒවා අඩංගු ප්‍රමාන, භාවිතා කල හැකි සත්ව විශේෂ ආදිය දැක්වෙන සත්ව ආහාර නිෂ්පාදකයා විසින් නිකුත් කල පත්‍රිකාවක් ප්‍රසම්පාදන ලියවිලි |

| | | |
|---|---|---|
| | | වලට අමුණා එවීම අත්‍යාවශ්‍ය වේ. |
| | (උ) | ගිවිසුම් කාලය තුල සත්ව ආහාර සැපයීමට ගිවිසගත් නිෂ්පාදන ආයතනය වසා දැමීම, වැඩ වර්ජන වැනි හේතුන් නිසා එම නිෂ්පාදන ආයතනයේ සැපයුම් ඇණහිටීම වැනි අනපේක්ෂිත අවස්ථාවන්හිදී පළාත් අධ්‍යක්ෂ (බ.ප.) විසින් නියම කරනු ලබන නිෂ්පාදන ආයතනයක සත්ව ආහාර සැපයීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී. |
| | (ඌ) | සපයනු ලබන සත්ව ආහාර වරින්වර අවශ්‍යයතාවයන් අනුව රසායනාගාර පරීක්ෂාවකට යවනු ලබන අතර ඒ සඳහා වැයවන මුදල් සැපයුම් කරු විසින් දැරිය යුතුවේ. |
| 16. | ප්‍රමාණාත්මක අලාභ. | |
| | | කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක වන කාලය තුල ඉල්ලා ඇති සත්ව ආහාර නිසි වේලාවට සැපයීමට අපොහොසත් වුවහොත් හෝ ගුණාත්මක බවින් අඩු හෝ අවස්ථාවක කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාණනය කල අලාභ සඳහා අධිභාරයක් ගෙවීමට  සැපයුම් කරු එකගවේ . සපයනු ලබන සත්ව ආහාර ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් සහ එදින නියමිත වේලාවට සැපයීම නොකල හොත් ද්‍රව්‍ය වටිනාකම සහ 10% අධිභාරයකට යටත් කළ හැකිය. |
| 17. | පාලනයෙන් බැහැරව සිදු වන ක්‍රියා | |
| | | කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක වන කාලයේ පාලනයෙන් බැහැර ක්‍රියාවක් ලෙස ගැනෙන යුද කැළඹීම , වැඩ වර්ජන, සේවයෙන් පිටමන් කිරීම, වසංගත රෝග, භූ චලන ගිනි කඳු හා ජල ගැලීම් හෝ වෙනත් බාධා හේතු කොට ගෙන ලංසුකරුට සිදු විය හැකි යම් අලාභයක් සම්බන්ධයෙන් රජයේ පාර්ශවය වෙත කිසිදු වගකීමක් හෝ බැඳීමක් නොමැත. |
| 18. | ශ්‍රී ලංකා නීතිය. | |
| | | මෙම කොන්ත්‍රාත්තුවේ ප්‍රතිඵලයක් නිසා අත්කරගනු ලබන යම් කොන්ත්‍රාත් ගිවිසුම් ශ්‍රී  ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ නීතිය මගින් පාලනය වන ඊට අනුව<br>අර්ථකතනය විය යුතුය. |
| 19. | | ලංසුකරු  ප්‍රසම්පාදනයේ කොන්දේසි පිළිබද ව සපුරා දැන සිටිය යුතුය. කවර  අවස්ථාවක වත් තොරතුරු නොලැබීම ගැන හෝ ඌණ තොරතුරු පිළිබද කෙරෙන  ආයාචනා භාර ගනු නොලැබේ . |
| 20. | | බේරුම් කිරීම පිළිබද තීරණය ගනු ලබන්නේ 1995 අංක 11 දරණ බේරුම් කිරීමේ පනත අනුවය. |
| 21 | ලංසු සුරක්ෂනය | |
| | ලංසු කරු විසින් ඉදිරිපත් කරනු ලබන ලංසුවේ වටිනාකමින් 1%ක මුදලක් ලංසු සුරක්ෂනයක් ලෙසට ඉදිරිපත් කළයුතු අතර එය බැංකු ඇපකරයකින් හෝ පලාත් කෘෂිකර්ම අධ්‍යක්ෂගේ ගිණුමේ තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතවේ | |
| 22. | කාර්ය සාධන සුරක්ෂනය | |
| | ලංසුව පිලි ගැනීමෙන් පසුව සැපයුම් කරු වෙත ලිඛිත දැනුම් දීමක් කිරීමෙන් පසුව දින 14ක් ඇතුලත ඇණවුමේ වටිනාකමින් 10% ක කාර්ය සාධන සුරක්ෂනය තැබිය යුතුවේ.එම කාර්ය සාධන සුරක්ෂනය බැංකු ඇපකරයකින් හෝ නියමිත මුදල පළාත් අධ්‍යක්ෂ නමින් පලාත් අධ්‍යක්ෂ ගිණුමේ තැන්පත් කිරීමෙන් සිදු කළ හැක. නියමිත දිනයට කාර්ය සාධන සුරක්ෂනය තැබිමට අපොහොසත් වන්නේ නම් ඇණවුම පැහැර හැරියා සේ සලකා ජාතික / බස්නාහිර පලාත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරුනු ඇත. | |
| | | |

සභාපති
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (බ.ප)
බස්නාහිර පළාත් සභාව,
7 වන මහල, අංක 204,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

SPECIMAN

ඇමුණුම"ආ"

## ප්‍රසම්පාදන ආකෘති පත්‍රය

**<u>2024.05.01 සිට 2024.10.31 දක්වා කාලය තුළ බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ</u>**

**<u>අවශ්‍යයතාවයන් සඳහා සත්ව ආහාර (compound animal feed )සැපයීම</u>**

-------------------------------------------------------------------යනස්ථානයේ පදිංචි මෙහිමින් මතු ලංසුකරු යයි හඳුන්වනු ලබන මම/අපි---------------------දින දැන්වීම් ප්‍රකාර මෙහි පහත සඳහන් නියමයන් කොන්දේසි සහ ගිවිස ගැනිම් මත මෙහි සඳහන් කරනු ලබනමිළ ගණන් යටතේ සත්ව ආහාර සැපයීම සඳහා මෙම ලංසුව ඉදිරිපත්කරමි/කරමු.

01.**<u> 2024.05.01 සිට 2024.10.31</u>** කාලය තුල සත්ව ආහාර සැපයීම සඳහාසම්පූර්ණ මිළ ගණන රුපියල්-------------------(අකුරින් රුපියල්----------------------------------------------------------------------------)වැට්බදූ රහිත වන අතර වැට්බදූසහිත මුදල රුපියල්--------------------------------------(අකුරින් රුපියල්------------------------------------------------------------------------------)

02.මෙම ලංසුව පිළිගනු ලැබුවහොත් ලංසුවට අදාල විස්තර ප්‍රකාශයෙහි සඳහන් නියමයන්හා කොන්දේසි මෙන්ම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පලාත් අධ්‍යක්ෂ විසින් නිකුත් කරනු ලබන කොන්දේසිවල (මෙහි "අ" ඇමුණුම වශයෙන් මීට අමුණා ඇති) ඇති නියමයන්ද සාමුහිකවත් වෙන්ව වෙන්වත් ඉටුකිරීමට බස්නාහිර පලාතේ කෘෂිකර්ම අධ්‍යක්ෂ සමග නීත්‍යානුකූලව ගිවිස ගනී.

03.තවද ලංසුව පිළිගනු ලැබුවහොත් ලංසුව පිලිගත් බව මා වෙත දැනුම් දුන් දින සිට ක්‍රියාත්මක වන පරිදි මීට අමුණා ඇති එකි විස්තර ප්‍රකාශයෙහි සඳහන් නියමයන් කොන්දේසි හා ගිවිසගැනීම් වලින් බැදී සිටීමට එකඟවන අතර එකී විස්තර ප්‍රකාශයෙහි මෙන්ම අනෙක් පොදු කොන්දේසිවල සඳහන් නියමයන් හා කොන්දේසි වලටද එකඟවන්නෙමි.

04. උප ලේඛනයේ සඳහන් අයිතම, නිසි ප්‍රමිතියෙන් හා නියමිත කල් ඉකුත් කාලය සහිතව සැපයීමට එකඟ වෙමි.

05.මාගේ/අපගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ඇමුණුම් අඩංගු ලංසු ලේඛණ කට්ටලය අත්සන් කොට ඇත.
ලංසු ලේඛණ කට්ටලය

1. ප්‍රසම්පාදනය පිලිබඳ පොදු කොන්දේසි "අ" ඇමුණුම
11.ප්‍රසම්පාදන ආකෘති පත්‍රය "ආ" ඇමුණුම
111. ඇස්තමේන්තු ප්‍රමාණයන් සහ මිල උපලේඛණය "ඇ"ඇමුණුම

නම/සමාගම.-----------------------------------------------------------------------------------

ලිපිනය. -----------------------------------------------------------------------------------

දූරකථන අංකය.-------------------------------------- ෆැක්ස් අංකය--------------------------

වැට් ලියාපදංචි අංකය--------------------------------- ව්‍යාපාර ලියාපදිංචි--------------------

-------------------------------------------

ලංසුකරුගේ අත්සන සහ නිල මුද්‍රාව

සාක්ෂිකරුගේ අත්සන -----------------------------------------------------------

සාක්ෂිකරුගේ නම සහ ලිපිනය -----------------------------------------------------

SPECIMAN

**ඇමුණුම"ඇ"**

කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය (බ.ප.) පලාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (බ.ප.)

ඇස්තමේන්තු ප්‍රමාණයන් සහ මිළ උපලේඛනය.

ඉලක්කමින් රු. අකුරින් රු.

ලංසු වටිනාකම=---------------------- ------------------------------------

වැට් බදු ප්‍රමාණය=--------------------- -------------------------------------

මුළු වටිනාකම =--------------------- -------------------------------------

ලංසුකරු/ආයතනයේ නම=-----------------------------------------------------

ලංසු ආයතනයේ ලිපිනය=-----------------------------------------------------

-------------------------------------------------------------------------------------

-------------------------------------------------------------------------------------

වැට් බදු ලියාපදිංචි අංකය=-----------------------------------------------------

ව්‍යාපාර ලියාපදිංචි අංකය=-----------------------------------------------------

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

------------------------------------------------------

ලංසුකරු/ආයතන ප්‍රධානියාගේ අත්සන ආයතනයේ නිල මුද්‍රව.

සාක්ෂි-

නම සහ ලිපිනය . අත්සන.

1.----------------------------------------------------- ------------------------

2.----------------------------------------------------- -------------------------

SPECIMAN

**Compliance Sheet**

1. Layer Feed (crumbles) - (50 Kg Bag)

Brand/ Name of Manufacture - ……………………………………………..

| | Parameter | Require specification | Supplier's specification |
|---|---|---|---|
| Nutrients | | | |
| | Crude protein % | 16.5 – 17.0 | |
| | Crude Fat % (max) | 7.0 | |
| | Crude Fiber % (max) | 7.0 | |
| | Moisture % (max) | 12.0 | |
| | Ash % (max) | 14.0 | |
| | Acid Insoluble Ash (sand) % (max) | 2.0 | |
| Amino Acids | | | |
| | Lysine % | 0.70 – 0.74 | |
| | Methionine | 0.34 – 0.35 | |
| | Methionine & Cysteine % | 0.60 – 0.62 | |
| | Tryptophan% | 0.16 – 0.18 | |
| Mineral | | | |
| | Calcium % (min) | 3.00 | |
| | Total Phosphorous % (min) | 0.65 | |
| | Available Phosphorus % (min) | 0.40 | |
| Energy | | | |
| | Metabolisible energy (kcal/kg) | 2650 - 2800 | |

2. Grower Feed - (50 Kg Bag)
   Brand/ Name of Manufacture - ……………………………………………..

| | Parameter | Require specification | Supplier's specification |
|---|---|---|---|
| Nutrients | | | |
| | Crude protein % | 15.0 – 15.5 | |
| | Crude Fat % (max) | 7.0 | |
| | Crude Fiber % (max) | 7.0 | |
| | Moisture % (max) | 12.0 | |
| | Ash % (max) | 7.0 | |
| | Acid Insoluble Ash (sand) % (max) | 2.0 | |
| Amino Acids | | | |
| | Lysine % | 0.78 – 0.80 | |
| | Methionine | 0.32 – 0.34 | |
| | Methionine & Cysteine % | 0.55 – 0.58 | |
| | Tryptophan% | 0.16 – 0.18 | |
| Mineral | | | |
| | Calcium % (min) | 0.90 | |
| | Total Phosphorous % (min) | 0.60 | |
| | Available Phosphorus % (min) | 0.40 | |
| Energy | | | |
| | Metabolisible energy (kcal/kg) | 2650 - 2750 | |

SPECIMAN

3. Chick Starter Feed - (25 Kg Bag)
Brand/ Name of Manufacture - ……………………………………………..

| | Parameter | Require specification | Supplier's specification |
|---|---|---|---|
| Nutrients | | | |
| | Crude protein % | 18.5 – 19.0 | |
| | Crude Fat % (max) | 6.0 | |
| | Crude Fiber % (max) | 6.0 | |
| | Moisture % (max) | 12.0 | |
| | Ash % (max) | 7.0 | |
| | Acid Insoluble Ash (sand) % (max) | 2.0 | |
| Amino Acids | | | |
| | Lysine % | 0.9 – 0.95 | |
| | Methionine | 0.36 – 0.38 | |
| | Methionine & Cysteine % | 0.65 – 0.67 | |
| | Tryptophan% | 0.18 – 0.20 | |
| Mineral | | | |
| | Calcium % (min) | 0.95 | |
| | Total Phosphorous % (min) | 0.7 | |
| | Available Phosphorus % (min) | 0.4 | |
| Energy | | | |
| | Metabolisible energy (kcal/kg) | 2750 - 2800 | |

4. Cattle Feed - (25 Kg Bag)
Brand/ Name of Manufacture - ……………………………………………..

| Parameter | Require specification | Supplier's specification |
|---|---|---|
| Metabolizable Energy (Kilo Cal/Kg) (Minimum) | 2500 | |
| Crude Protein % (Minimum) | 16.0 | |
| Either Extracts % (Maximum) | 6.0 | |
| Crude Fiber % (Maximum) | 10.0 | |
| Calcium % (Minimum) | 0.95 | |
| Phosphorus % (Minimum) | 0.65 | |
| Moisture (Maximum) | 12.0 | |

5. Boiler Starter - (50 Kg Bag)
Brand/ Name of Manufacture - ……………………………………………..

| Parameter | Require specification | Supplier's specification |
|---|---|---|
| Metabolizable Energy (Kilo Cal/Kg) (Minimum) | 3000 | |
| Crude Protein % (Minimum) | 21.5% | |
| Fat % (Minimum) | 4.0% | |
| Crude Fiber % (Maximum) | 4.5% | |
| Calcium % | 1.0-1.2% | |
| Phosphorus % | 0.7-1.0% | |
| Ash (Maximum) | 7.0% | |
| Methionine (Minimum) | 0.55% | |
| Energy (Minimum) | Please Specify | |

SPECIMAN

6. Shell (25 Kg Bag)
Brand/ Name of Manufacture - ……………………………………………..

| Parameter | Require specification | Supplier's specification |
|---|---|---|
| Should be free of stones, sand and debris | Compulsory | |
| Should be small pieces | Compulsory | |

Feeds Supplemented with Vitamins A, D3, K3, B1, B2, B6, B12,E,C,Pantothenic Acid, Nicotinic Acid, Biotin, Folic Acid, Copper, Ferrous, Cobalt, Iodine, Manganese, Choline, Anti-Oxidants, Approved Growth Promoters will be preferred in the technical evaluation.

Name of the company:

Authorized person's Name: Authorized person's signature:

Company seal:

Date:……………

SPECIMAN

To - Provincial Director,

Department of Agriculture,

Western Province.

PRICE SCHDULE

| No. | Item | Qty. | Brand | Unit price | Total price |
|---|---|---|---|---|---|
| 1 | Layer Crumble (50 Kg Bag) | 2016 | | | |
| 2 | Grower Crumble (50 Kg Bag) | 170 | | | |
| 3 | chick starter (25 Kg Bag) | 56 | | | |
| 4 | Cattle Feed (25 Kg Bag) | 225 | | | |
| 5 | Broiler Starter (50 Kg Bag) | 30 | | | |
| 6 | Shell (25 Kg Bag) | 56 | | | |
| | Total price without Vat | | | | |
| | Vat | | | | |
| | Total price with vat | | | | |

Name of the company:

Authorized person’s Name:

Authorized person’s signature:

Company seal:

Date:……………

SPECIMAN

ඇමුණුම ඇ

## <u>කොන්ත්‍රාත් ගිවිසුම</u>

**<u>2024.03.15 සිට 2025.03.15 දක්වා තුළ බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අවශ්‍යයතාවයන් සඳහා සත්ව ආහාර (compound animal feed) සැපයීමප්‍රසම්පාදනය සඳහා</u>**

බස්නාහිර පලාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (මෙහි මින් මතු අධ්‍යක්ෂ  වශයෙන් හඳුන්වනු ලබන අය) හෝ එම තනතුරට පත්වන වෙනත් අධ්‍යක්ෂවරයකු හෝ  මෙම ගිවිසුමේ පළමු පාර්ශ්වකරු ලෙස  හා ----------------------------------------------------------------හෝ ඔහුගේ /තත්වයට පත්වන මෙහි මින් මතු සැපයුම්කරු ලෙස හැදින්වෙන අය දෙවැනි පාර්ශවකරු ලෙස වැලිසර දි වර්ෂ 2024 --------------------දින පහත සඳහන් කරුණු මත ඇතුලත් වන ගිවිසුමේ වග නම්

1. අධ්‍යක්ෂ හෝ ඔහුගේ බලය ලත්  නියෝජිතයෙකු විසින් ලංසු පත්‍රය සමග අමුණා ඇති විස්තරයේ ඇතුලත් කර ඇති පරිදි කලින් කලට ලිඛිතව දන්වා සිටින පරිදි කොන්ත්‍රාත්කරු විසින් වර්ෂ **<u>2024.05.01 සිට 2024.10.31</u>** දින දක්වා අදාල සත්ව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ  අධ්‍යක්ෂ (බ.ප) වෙත සැපයිය යුතු වේ.

2. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ  අධ්‍යක්ෂ (බ.ප) විසින් පිළිගනු ලබන ලංසුවේ සඳහන් පරිදි මිළ ගණන් අනුව අත්සන් කරන ලද ඇණවුම් හා ලැබීම් වවුචර් පාදක කරගෙන සකසනු ලබන වවුචර් පත්‍ර ලැබීමෙන් දින 30 ක කාලයක් තුලදී චෙක්පත් මගින් සැපයුම්කරු වෙත ගෙවීම් කරනු ලැබේ.කිනම් මුදල් වර්ෂයකදී හෝ එම මුදල් වර්ෂය තුල සපයන ලද ද්‍රව්‍ය සඳහා (නියමිත කාලයේ දී ඉදිරිපත් නොකළ එවැනි ඉල්ලීම්) ගැන දෙසැම්බර් 31 න් පසු ඉදිරිපත් කරන බිල්පත්‍ර සඳහා ගෙවීම් කරනු නොලැබේ.

3. සැපයුම්කරු වෙත යොමු කරන ලද ඔහු විසින් සපයන ලද ඇණවුම් වල කුමන හෝ දෙයක් අධ්‍යක්ෂ හෝ ඔහු විසින් එසේ කරන ලෙස බලය පවරන ලද ඔහුගේ නිලධාරියකු විසින් ප්‍රමාණයෙන් හා අවශ්‍ය තත්වයට ප්‍රමිතීන්ට නො ගැලපෙන නිසා ප්‍රතික්ෂේප කළ හොත් දින 07ක් ඇතුලත ඊට අදාල නිවැරදි සත්ව ආහාර සැපයීමට සැපයුම්කරු පොරොන්දු වේ.

4.-5.1 වන ඡේදයේ හා 4 වන ඡේදයේ සඳහන් පරිදි කරන ලද නියමිත වේලාවන්ට සැපයීමට අපොහොසත් වීම හෝ ප්‍රතික්ෂේප කරන්නේ නම් අධ්‍යක්ෂ සිතන පරිදි යෝග්‍ය නම් එවැනි මිළකට එවැනි කුමන ස්ථානයකින් හෝ එවැනි සත්ව ආහාර මිළදී ගැනීමට අධ්‍යක්ෂට නිදහස ඇත. එවැනි මිළ දී ගැනීම්  සඳහා හෝ ඒ සඳහා වන ප්‍රවාහනය කිරීමට හා සැපයුම ප්‍රමාද වීම නිසා අවශ්‍ය මුදල අධ්‍යක්ෂ විසින් ඉල්ලා සිටි විටකදි  සැපයුම්කරු එවැනි වැඩිපුර ගෙවීමට සිදු වූ වියදම් ආපසු අධ්‍යක්ෂකට ගෙවීමට එකඟ වේ.

5.මෙම කොන්ත්‍රාත්තුව යටතේ  සැපයුම්කරුගෙන් අයවීමට ඇති යම් මුදලක්  වෙනත් කොන්ත්‍රාත්තුවකින් හෝ ඔහුට අනාගතයේදී ගෙවීමට ඇති ඔහුට අයත් මුදලකින් හෝ සුදුසුයැයි යන වෙනත් ක්‍රමයකින්  අය කර ගැනීමට  අධ්‍යක්ෂවරයාට බලය හිමිවේ.

6.ඉහත 1හා 4 ඡේදයේ නියමිත කාල සීමාව තුල ඇණවුම් කරන ලද සත්ව ආහාර දෙවතාවකට හෝ ඊට වැඩි වතාවලදී සැපයීමට සැපයුම්කරු අපොහොසත් වන්නේ නම් මෙම කොන්ත්‍රාත්තුවේ සඳහන් බැදීම් වලට  සැපයුම්කරු අපොහොසත් වී යැයි සලකා ඔහු අසාදු ලේඛණ ගත කිරීමටත් ඔහු තබා ඇති ඇප මුදල් රාජ සන්තක කිරීමටත්  කටයුතුකරනු ඇත.එසේම සැපයුම් කරු වෙත සැලකිය යුතු දඩ මුදලක් පැනවීමටත් එසේ පනවනු ලබන දඩු මුදල ඔහු වෙත ගෙවීමට ඇති මුදලකින් අයකර ගැනීමටත් සැපයුම් කරු එකගවේ.

7. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ  අධ්‍යක්ෂ ගෙන් ලබාගත් ලිඛිත අවසරයක් නොමැතිව මෙම කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත්කරු වෙත පැවරී ඇති බලතල හෝ වගකීම් වෙනත් පුද්ගලයකුට පැවරීම ,මාරු කිරීම හෝ බඳු දීම නොකළ යුතු වේ. කොන්ත්‍රාත්කරු මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධව ඇටෝනි බලය ශ්‍රී ලංකා ප්‍රජාත්‍රානන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් අසාදු ලේඛණගත කරනු  ලැබු පුද්ගලයෙකුට පැවරිය යුතු නොවේ.

8. මෙහි විස්තරයේ දක්වා ඇති සම්පූර්ණ සත්ව ආහාර ප්‍රමාණය ඉල්ලා සිටීම අධ්‍යක්ෂවරයා අනිවාර්යෙන් කල යුතු නොවේ . එම නිසා සැපයුම්කරු ට අධ්‍යක්ෂවරයා හෝ ශ්‍රී ලංකා සමාජවාදී ජන රජයෙන් කිසියම් සත්ව ආහාර ප්‍රමාණයක් නොඉල්ලා සිටීමෙන් අධ්‍යක්ෂ හෝ ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයෙන් හෝ අලාභ ඉල්ලීමට හිමිකමක් නැත.

SPECIMAN

09. වරින් වර අවශ්‍යතාවය පරිදි ඇණවුම් කරනු ලබන ප්‍රමාණය අඩු වැඩි කිරීමේ බලය අධ්‍යක්ෂ සතු වේ. සැපයුම්කරු විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් යටතේ නියමිත කාලය පුරාම සත්ත්ව ආහාර සැපයිය යුතු අතර මිල වැඩිවීමකට අවසර දෙනු නොලැබේ . විනිමය අනුපාතිකයේ සැලකිය යුතු වැඩි වීමක් සිදුවීම හේතුවෙන් ආහාර නිෂපාදන ආයතන සැලකිය යුතු මිල වැඩි කිරීමක් සිදු කර ඇති විටක ඒ සම්බන්ධව සිදු කරනු ලබන ඉල්ලීම් ප්‍රසම්පාදන කමිටුව විසින් සලකා බලා තීරණය කරනු ඇත.දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වරින්වර පවත්වනු ලබන රෙගුලාසි මත ගෙවිය යුතු වන සියලු බදු ගෙවීමට සැපයුම්කරු යටත් වනු ලැබේ. ලංසු පෝරමයේ සඳහන් කොන්දේසි සියල්ලම මෙම ගිවිසුමේ කොන්දේසි ලෙස සලකනු ලැබේ. කෙසේ වෙතත් එකී ලංසු කොන්දේසි පත්‍රිකාවේ යම් වගන්තියක් මෙම ගිවිසුමේ යම් වගන්තියක් හෝ වගන්ති සමග ගැටෙන්නේ නම් එකී වගන්තිය හෝ වගන්ති වලින් අධ්‍යක්ෂකට වඩාත් වාසිදායක වගන්තිය බලාත්මක වගන්තිය ලෙස පිළිගනු ලැබේ. මෙහි සඳහන් කොට ඇත්තා වූ කොන්දේසි වලින් ආවරණය නොවන යම් කරුණක් වේ නම අධ්‍යක්ෂකගේ අභිමතය පරිදි ක්‍රියා කරනු ලැබේ.

11. සැපයුම්කරු විසින් ඉදිරිපත් කර ඇති ඔහුගේ. . . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . දරණ ස්ථානයෙහි පිහිටි කාර්යයාලයට සැපයීම සඳහා කරන ඇණවුම් හා/ හෝ කොන්ත්‍රාත්තුව සම්බන්ධ දැන්වීම් යොමු කල යුතු බවට සැපයුම්කරු හා අධ්‍යක්ෂ යන දෙපාර්ශවයම එකග වේ . සැපයුම්කරු ගේ කාර්යාල ලිපිනයේ කිසියම් වෙනසක් සිදු වුව හොත් එය අධ්‍යක්ෂට දැන්විය යුතු අතර එවැනි දැන්වීමක් කරන තෙක් ඇණවුම හා වෙනත් දැන්විම් අධ්‍යක්ෂ ලග ඇති ලිපිනයට යැවීම එම ලිපි / ලැබීඇති බවට ප්‍රමානවත් සාක්ෂියක් ලෙස සැලකේ. පහත සඳහන් ස්ථානයන්හි හා දිනයන්හි දෙපක්ෂයම එකඟව සඳහන් කරන ලද සාක්ෂිකරුවන් ඉදිරිපිටදී මෙම ගිවිසුම අත්සන් කරන ලදී.

...............................................

අධ්‍යක්ෂගේ අත්සන සහ නිල මුද්‍රාව

පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (බ.ප)

බත්තරමුල්ල

පනවනු ලබූ කොන්දේසි වලට අනුකූලව මෙම ගිවිසුමේ කාර්යයන් ඉටු කිරීමට එකගවෙමි.

.............................................

කොන්ත්‍රාත්කරුගේ අත්සන සහ නිල මුද්‍රාව

2024---------මස---------------වැනි දිනදීය.

සාක්ෂිකරුවන්

| නම සහ ලිපිනයන් | අත්සන |
|---|---|
| 1.------------------------------------------------------------- | ------------------------- |
| 2.------------------------------------------------------------- | ------------------------ |

ඇමුණුම "ඉ"

<u>සත්ත්ව ආහාර බෙදා හැරිය යුතු ස්ථාන</u>

**අදාළ සත්ත්ව ආහාර පහත සඳහන් ස්ථාන වෙත එක් එක් ස්ථාන වෙත සඳහන් කර ඇති උපරිම ප්‍රමාණයන්ට යටත්ව ඉල්ලුම් කරන අවස්ථාවේදී ප්‍රවාහනය කර සැපයිය යුතුය.**

| | **Layer Feed - 50 kg** | **Grover Feed - 25kg** | **Cattel Feed - 25Kg** | **Shell - 25kg** | **Chick Starter -25 kg** | **Broiler Starter -50kg** |
|---|---|---|---|---|---|---|
| DATC Walpita | 432 | 60 | 25 | 1 | 36 | |
| DATC Ambepussa | 1150 | | 50 | 35 | | |
| DATC Horana | 180 | 110 | 30 | 20 | 20 | 30 |
| DATC Homagama | 254 | | 120 | | | |
| | **2016** | **170** | **225** | **56** | **56** | **30** |

## Service Location List

| **Institute** | **Address & Contact No's** |
|---|---|
| 1. District Agriculture Training Centre | Walpita Tel./ Fax. - 0332272296 |
| 2. District Agriculture Training Centre | Ambepussa Tel.033 2273359, Fax. 033 2273359 |
| 3. District Agriculture Training Centre | Kananwila, Horana. Tel. 034 2261107 |
| 4. District Agriculture Training Centre | Gabadawaththa, Homagama ,Tel. 011 2855745 |

SPECIMAN

ඇමුණුම "ඊ"

## ***FORM OF BID SECURITY/ GURANTEE***

*[this Bank Guarantee form shall be filled in accordance with the instructions indicated in brackets]*

……………………………………………………………………………………………………………………

*[Insert issuing agency's name and address of issuing branch or office]*-

**Beneficiary:** Provincial Director of Agriculture,

Provincial Department of Agriculture Office -Western Province

7Th Floor, Provincial Council Complex, Denzill Kobbekaduwa Mawatha, Battaramaulla

**Date:** ....................................................*[insert (by issuing agency) date]*

**BID GUARANTEE No.:**………………………………………………*[insert (by issuing agency) number]*

We have been informed that ………………………………………………………...*[insert (by issuing agency) name of the Bidder; if a joint venture, list complete legal names of partners]* (hereinafter called "the Bidder") has submitted to you its bid dated ………………………*[insert (by issuing agency) date]* (hereinafter called "the Bid") for the supply of *[insert name of Supplier]* under Invitation for Bids No. ……………………….*[insert IFB number]* ("the IFB").

Furthermore, we understand that, according to your conditions, Bids must be supported by a Bid Guarantee.

At the request of the Bidder, we ………………………*[insert name of issuing agency]* hereby irrevocably undertake to pay you any sum or sums not exceeding in total an amount of …………………...*[insert amount in figures]* ……………………….. *[insert amount in words]*) upon receipt by us of your first demand in writing accompanied by a written statement stating that the Bidder is in breach of its obligation(s) under the bid conditions, because the Bidder:

(a) Has withdrawn its Bid during the period of bid validity specified; or

(b) Does not accept the correction of errors in accordance with the Instructions to Bidders (hereinafter "the ITB"); or

(c) having been notified of the acceptance of its Bid by the Purchaser during the period of bid validity, (i) fails or refuses to execute the Contract Form, if required, or (ii) fails or refuses to furnish the Performance Security, in accordance with the ITB.

This Guarantee shall expire: (a) if the Bidder is the successful bidder, upon our receipt of copies of the Contract signed by the Bidder and of the Performance Security issued to you by the Bidder; or (b) if the Bidder is not the successful bidder, upon the earlier of (i) our receipt of a copy of your notification to the Bidder that the Bidder was unsuccessful, otherwise it will remain in force up to ………........... *(insert date)*

Consequently, any demand for payment under this Guarantee must be received by us at the office on or before that date ………………………………….

……………………………………….......

[Signature(s) of authorized representative(s) ]

SPECIMAN